


# හෙවනැලි මිය යන හැන්දෑවේ

අපගේ ළමා වියේත් තුරුණු වියේත් මතකයන් මුළු ජීවිතය පුරාම මිහිරක් එක් කරයි. ඒයා මිහිරි වුවත් අමිහිරි වුවත් මතකය නම් මිහිරක් ම යි. ඒ අතරින් මිහිරි දේ පිළිබඳව මතකය මිහිරෙන් මිහිරක් ම වෙයි.

කුඩා කල අප ඇසූ නිර්මාණාත්මක ගී කීපයක් ඇතුලත් සංගත තැටියක් සිඩ්නි නුවරත් මෑතකදී අප වෙත ලැබිණ. ඒ මෛත්‍රී පනාගොඩ ප්‍රවීණ ගී පද නිබන්ධකයාණන් ලියූ ගී එකතුවක් වන "සුදුවැලි" සංගත තැටියයි. ආචාර්ය ප්‍රේමසිරි කේමදාස, ලයනල් අල්ගම වැනි ප්‍රවීනයන්ගේ නිර්මාණාත්මක සංගීතයෙන් මෙන්ම, නීලා වික්‍රමසිංහ, ටී.එම්. ජයරත්න, එච්.ආර්. ජෝතිපාල, නිරංජලා සරෝජිනී, විශාරද අමරා රණතුංග, අබේවර්ධන බාලසූරිය වැනි ප්‍රවීණයින්ගේ ගායනාවලින් හැඩවුණු "සුදු වැලි" ගී එකතුවට සිඩ්නි නුවර වෙසෙන ගී හිතකාමීන්ගේ දායකත්වය ද ලැබී ඇත්තේය. හැත්තෑව දශකයේ නැවුම් අදහස් සමඟින් ගීතවත් වූ "ප්‍රබුද්ධ ගී" අතර මෛත්‍රී ගේ දායකත්වය ඉහළයි. "අහස බලාපන් පුතුනේ", "සුදුවැලි මතුපිට", "පාවී පාවී මේ එන්නේ", "හෙට උපදින පුංචි පුතේ", "මම යනවා මම යනවා" අපගේ මිහිරි මතකයේ රැඳුන එවන් මිහිරි ගී කීපයක්.

මෛත්‍රී පනාගොඩ පිළිබඳව මෙවර "ගී සඳැළුව" ලිපියෙන් සිහිපත් කිරීමට විශේෂ හේතුවක් වෙයි. මෑත කාලයේදී පණ්ඩිත් අමරදේවයන් විසින් තනුව නිර්මාණය කරගෙන ගායනා කළ මෛත්‍රීගේ ගීතය පිළිබඳව සටහන් තැබීමයි ඒ. වියපත් අමරදේවයන්ගේ මධුරතම හඬින් පද පෙළක් ගායනා වන්නට සැබැවින්ම ගී පද නිබන්ධකයෙකු වාසනාවන්ත විය යුතුයි. ගීය පිළිබඳව අමරදේවයන් සහ එහි සංගීත සංයෝජනය කළ ආචාර්ය රෝහන වීරසිංහයන් කළ ප්‍රකාශ දෙකකින් 2014 වසරේ මුලම "ගී සඳැළුව" සැරසෙයි.

"මෛත්‍රී පනාගොඩ නැමැති මේ සහෘදයාගේ ගී එකතුව ලැබුණ ම මගේ පුතා කිව්වා කැමති ගීතයක් තෝරගන්න කියලා......" අමරදේවයන් සිය හඬ අවදි කරවයි.

"මම ඉතින් තෝරගත්තේ හෙවනැලි මිය යන හැන්දෑවේ ගීතය. මේ ගීතයට මගේ ජීවිතයේ අනුවේදනීය සිද්ධියකුත් සම්බන්ධයි. මොකද "ලංකාදීප" ශිෂ්‍යත්ව අරමුදලින් මාව ලක්නව් භාත් ඛණ්ඩයේ සංගීත විශ්ව විද්‍යාලයට යැව්වේ 1923 ඔක්තොම්බර් මාසයේ. ඒ යනකොට මගේ පියා ඉතාමත් අසනීප තත්ත්වයෙන් හිටියේ. මම එහේ ඉගෙන ගන්න අතරතුරේදී මගේ පියා මිය ගියා. නමුත් මට ඒ ගැන දැනුම් දුන්නෙ නෑ. මොකට මාව එහේ යවපු කමිටුව තීරණය කරලා තියෙනවා ඒක මගේ අධ්‍යාපනයට හානියක් වනා නිසා නොකියා සිටින්නට."

"මම පවුලේ බාලයා. තාත්තා නැතිවෙන්න කිට්ටුව තාත්තා අහල තියෙනවා "පොඩ්ඩා එයි ද ?" කියලා. අක්කලා කිව්වලු "ඔව්, එයි" කියලා. ඉතින් මට ඒ අනුවේදනීය සිද්ධිය මතක් වුණා මේ පද පෙළ දුටුවම."

"ඉතින් මම මේ රචනාව මහත් සේ අගය කරනවා. ඒක ගැයීමට ලැබීමත් මගේ භාග්‍යයක්. මේකට රෝහණ සම්බන්ධ වීමත් ප්‍රසාදාත්මක කාරණයක්. ඔහු මට නිතරම අපරිමිත සහය දෙන ඉතා හොඳ මිනිසත් ගුණ තියෙන සංගීතවේදියෙක්. ජීවිතයේ



සඳෑ සමයේ ඉන්න මට මෙවැනි දෙයක් නිර්මාණය කිරීමට ලැබීම මගේ ජීවිතයේ ලැබුණ භාග්‍යයක් සේ සළකනවා."

ගීයට දායක වීමට ලැබීම පිළිබඳව ආචාර්ය රෝහණ වීරසිංහයන් කතා කරන්නේ උතුරා යන සතුටින්.....

"මේ පිළිබඳව මට ඇති වී තියෙන්නේ හද උතුරා යන තරම් සතුටක්. අමරදේවයන්ගේ නවතම ගීයකට කිසියම් අන්දමකට දායක වන්නට ලැබීම මා ජීවිතයේ ලැබූ උතුම්ම අවස්ථාවක්. මේ අවස්ථාව ලබාදීමට මට ආරාධනා කිරීම පිළිබඳව මෛත්‍රී පනාගොඩ මහත්මයාට මම ස්තූතිවන්ත



වෙනවා. ඒ වගේම අමරදේවයන් මා පිළිබඳව තැබූ විශ්වාසයත් අගය කරනවා."

මෙතෙක් ජීවිතයේ මා කළ කලා කටයුතු සියල්ල තරාදියක එක පැත්තකටත්, මේ නිර්මාණය අනෙක් පැත්තටත් දැම්මොත් මේ ගීතයේ පැත්ත බර වැඩි වෙනවා. ඒ විදියටයි මම මේ නිර්මාණය විඳින්නේ. එතුමා ලවා තනුව නිර්මාණය කරවාගෙන සංගීත සංයෝජනය කරලා, පටිගත කරලා, හඬ කවන්නට මාස පහක් පමණ ගතවුණා. නමුත් මෙහි කෙළවර ප්‍රතිපලය අති විශිෂ්ට නිර්මාණයක් බිහිවුණා. මීට පස්සේ මට උනන්දුවක් ඇති වුණා අමරදේව ලවා මේ වාගේ ගී එකතුවක්ම කරන්න." වීරසිංහයන්ගේ හඬයි ඒ.

ඒ ගී එකකුවේ කටයුතු හමාරවී ඇත්තේය. අනෙකුත් ගී නිබන්ධකයන්ගේ ද දායකත්වයෙන් නිර්මාණය වූ ඒ එකතුව නුදුරේදීම එළි දැක්වීමට නියමිතයි.

සිඩ්නි නුවර වෙසෙන මෛත්‍රී පනාගොඩ වෘත්තියෙන් අධි නීතීඥනරයෙකි. මහාචාර්ය ජේ.බී. දිසානායක, දයානන්ද ගුණවර්ධන, විමල් අභයසුන්දර, ජෝර්ජ් ලෙස්ලි රණසිංහ, ඩෝල්ටන් අල්විස්, ප්‍රේමකීර්ති ද අල්විස්, කුලරත්න ආරියවංශ, මහාචාර්ය ප්‍රනීත් අභයසුන්දර, බණ්ඩාර කේ. විජේතුංග, සුනන්ද මහේන්ද්‍ර, දිලීප අබේසේකර, ධම්මික බණ්ඩාර, ආනන්ද පද්මසිරි, සිසිර දිසානායක වැනි ගී පද රචකයින් පරපුරක්ම බිහි කළ කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි මෛත්‍රී. මව්බිමේ උසස්පෙළ හදාරන කාලයේ සිංහල භාෂාවේ පරිණත බව වෙනුවෙන් එවකට එහි අග්‍රාණ්ඩුකාරවරයා වූ විලියම් ගොපල්ලව මැතිතුමන් අතින් විශිෂ්ඨතම රන් වරණ ලාංචනය ලැබීය. ප්‍රබුද්ධ ගී මෙන්ම ළමා ගී රචනයේද මෛත්‍රී දස්කම් දැක්වීය. උසස් පෙළ සඳහා විද්‍යා විෂයයන් හැදෑරුව ද නීතය හදාරමින් ඒ මගෙහි ඉදිරියට යන මෛත්‍රී ඉන් ලත් ජයග්‍රහණ ද බොහෝමයි.

ඕස්ට්‍රේලියාවේ ආදි වාසීන් හට වූ අසාධාරණකම් වෙනුවෙන් පෙනී සිටිමින් ඔහුගත් පියවර ලේඛණ ගත වී ඇති අතර ලක් පුතෙකුට මෙම ක්ෂේත්‍රයේ ලැබිය හැකි ඉහළම තැන ලැබීමට තරම් මෛත්‍රී දක්ෂයෙකු විය.

ආනන්දයේ "කිරණ" බිත්ති පුවත් පතින් උපන් මෛත්‍රී පනාගොඩ කවියා, ගී පද රචකයෙකු ලෙසින් කරනා නිහඬ සේවය අද මුළු දියත පුරා රසිකයින් රසවත් කරවයි. අපි ඔහුට ජය පතන්නෙමු.

ADVICE ON LEGAL MATTERS

Business & Commercial Law
Sale & Purchase of Busines | Leases | Franchises
Conveyancing
Residential, Commercial & Rural
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions
Probate & Testamentary
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration
Family Law
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements
Migration Law
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY
LAWYERS

Senanie Kurukularatne
Barrister & Solicitor
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
17 Glenview Rise Berwick VIC 3806 Australia

Tel +61 3 8786 9682
Fax +61 3 8786 9681
Mobile +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au